රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

www.plusinfo.lk

## 2026-03-03 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම පිණිස පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම - (විෂය අංක 45)**

රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කරමින් අවශ්‍යතා, ප්‍රමුඛතා හා කාලරාමු හඳුනාගෙන ඒ ආශ්‍රිතව අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු බඳවාගැනීම් ප්‍රමාණයන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නිලධාරි කමිටුවක් පත් කිරීම පිණිස 2024-12-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ ඒ අමාත්‍යාංශ විසින් එම අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතනවල පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා එකී කමිටුව වෙත යොමු කර ඇති ඉල්ලීම් පිළිබඳව 2026-02-12 දින පැවති එම කමිටු රැස්වීමේදී සලකා බලා, ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව, පහත සඳහන් බඳවාගැනීම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

| අනු අංකය | අමාත්‍යාංශ/පළාත් සභා | බඳවාගැනීම් සඳහා කමිටුව විසින් නිර්දේශ කරන ලද තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 300 |
| 2. | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | 67 |
| 3. | ආරක්ෂක අමාත්‍යාංශය | 9,794 |
| 4. | කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 112 |
| 5. | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 121 |
| 6. | බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 7. | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 1,915 |
| 8. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 66 |
| 9. | කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය | 60 |
| 10. | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 776 |
| 11. | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 201 |
| 12. | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 214 |
| 13. | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය | 15 |
| 14. | පරිසර අමාත්‍යාංශය | 213 |
| 15. | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 06 |
| 16. | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | 03 |
| 17. | කම්කරු අමාත්‍යාංශය | 01 |
| 18. | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | 09 |
| 19. | වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 339 |
| 20. | බලශක්ති අමාත්‍යාංශය | 01 |
| 21. | වෙළෙඳ,වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය | 50 |
| 22. | නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය | 10 |
| 23. | මධ්‍යම පළාත් සභාව | 22 |
| 24. | සබරගමුව පළාත් සභාව | 236 |
| 25. | වයඹ පළාත් සභාව | 401 |
| 26. | උතුරු මැද පළාත් සභාව | 66 |
| 27. | නැගෙනහිර පළාත් සභාව | 282 |
| 28. | ඌව පළාත් සභාව | 146 |
| 29. | උතුරු පළාත් සභාව | 411 |
| | **මුළු සංඛ්‍යාව** | **15,839** |